# ඉවර නොවෙන විස්කෝතුව



කසුන්දි වීරසිංහ

# ඉවර නොවෙන විස්කෝත්තුව

**කසුන්දි වීරසිංහ**

**කර්තෘ**

*පලමු දිග හැරුම*

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

8 ශ්‍රේණිය B

2025.02.22

ISBN 978-624-208-752-8

# පිදුම

මා මෙලොවට බිහි කර

කුඩා කල පටන් අදරින් රැක බලා ගන්නා

මාගේ මෑණියන්ට ද

නිරතුරුවම යෝධ සෙවණැල්ල ක් මෙන් මා

අසල රැඳෙමින්මා දිරිමත් කරවන

මාගේ පියාණන්ටද

මැසිවිලි නගමින් වුව ද

නිරතුරුව මා හා රැඳෙමින්

මා කරන සියලු කටයුතුවලට

උපකාර කරන මාගේ ආදරණීය සොහොයුරියටද

මෙම පොත් පිංච ය සෑදීමේදී  නිරතුරුව මා හට

උපකාර කළ මගේ ආදරණීය මිතුරියන්ටද

ආදරය, ගෞරවය  පෙරදැරිව මෙම පොත්

පිංචය

පුදමි...

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යයමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකාරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කර්තෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"**ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිපලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

“අනේ  අම්මා... විනාඩි පහක් දෙන්නකෝ...” හිසේ සිට දෙපතුල දක්වා නැවැතත් ඇඳ ඇතිරිල්ලෙන්  වසාගනිමින්,කසුනි තම මවගෙන් අයැද සිටියාය.

“පොඩ්ඩී මං ආයේ කියන්නේ නෑ... අලුත් අවුරුද්දේ පලවෙනි දවසෙම ඉස්කොලේ යන්නේ නැතුව ඉන්නද කල්පනාව?” එසේ හඬ අවදි කරමින් කසුනිගේ මව කාමරයට පැමිණ විදුලි පහන දැල්වූවාය.

අඩවන් දෙනෙතින් යුතුව ඇඳ ඇතිරිල්ලෙන් මුව නිරාවරණය කල කසුනි,අම්මා දෙස බැලුවා ය.

“හරි හරි... ඔච්චර කෑ ගහන්න ඕනේ නෑනේ... මං ලෑස්ති වෙන්නම්...” නිදි බර ගතියෙන් ම ඇඳෙන් නැගිට ගත් කසුනි, දොරේ වැදීමට ගොස් බේරුණේ අනූනවයෙනි.

දත් මැද, මුහුණ සෝදාගත් ඇය, කොටු කර සහිත තම  පාසල් නිල ඇඳුමට මාරු වුණා ය.  කොපමණ ප්‍රමාද වුවත්, දිනපතා ම උදෑසන ආහාරය රැගෙන නිවසින් පිටත් වීම ඇගේ පුරුද්දයි.

කසුනි මවට හා පියාට වැඳ, පාසල් බස් රථයෙන් පාසල වෙත පිය නැගී..

කසුනි යනු, මධ්‍යම ප්‍රමාණයේ ශරීරයකින් හෙබි උසැති දැරිය කි. පාසලේ බාලදක්ෂිකාවක වන ඇය, විවිධ සමිති සමාගම්වල ද ක්‍රියාකාරී සාමාජිකාවකි. පාසලේ බාහිර ක්‍රියාකාරකම් වලට මෙන්ම අධ්‍යාපන කටයුතු වලත් කැපීපෙනෙන දක්ෂතාවලින් පෙන්වන ඇය, විනයගරුක ශිෂ්‍යාවකි.

නව වසරේ, නව වන ශ්‍රේණියේ ඉගෙනුම ලැබීමට නියමිත ඇය,
කම්මැලි වනුයේ පාසල් යැමට උදෑසන අවදි වීමට පමණි

● ● ●

“ගුඩ් මෝනින් කසුනි...මොකද මේ මූණත් මැලවිලා?” ඒ සජනිගේ හඬය. ඇය කසුනිගේ කුඩා කල පටන් හොඳම මිතුරිය යි.

“ගුඩ් මෝනින්... මට කිසි ප්‍රශ්නයක් නෑ අනේ...දන්නෙ නැද්ද උදේ නැගිටින එක තමයි ලොකුම ප්‍රශ්නෙ...” කසුනි ඇනුමක් අරිමින් ම පිළිතුරු දුන්නා ය. සීනුව නාද විය.

“යමු යමු...” කසුනිගේ අත අල්ලාගත් සජනි ඔවුන්ගේ නව පංති කාමරය වෙත පිය නැග්ගා ය. උදෑසන ආගමික වතාවත් වල නිරත වූ පසු ,අසුන් ගත් ළමයින්ගේ හඬ ඝෝෂාකාරී විය.

“අලුත් පන්ති භාර මැඩම් හරි සැරයිලුනේ...”දිනිති කතාවට මුල පිරුවා ය. “මාත් අහලා තියෙන හැටියට නම් ඒ මැඩම් හෝම් වර්ක් කරේ නැත්නම් ඒ පොතෙන් ම ගහනවලු.” වෙව්ලන ස්වරයෙන් එසේ සංවාදයට එක් වූයේ සදනිය.

දිනිති,සජනි,සදනි හා කසුනි යනු, කුඩා කල පටන් එකාවන්ව සිටි මිතුරු කැලකි. පන්ති කාමරය තුළ දීත් සිව්දෙනා එක පෙළට ම අසුන් ගෙන සිටියි.

“අන්න... මැඩම් එනවා..” අසුනින් නැගිටින සිසුන් පිරිසට එක්වෙමින් කසුනි කීවා ය. පන්තිය මීයට පිම්බාක් සේ ය.

“ආයුබෝවන් ළමයි...” ගුණරත්න ගුරුතුමිය ගුරු මේසය මත පොත් මිටිය තබා කීවා ය.

“ආයුබෝවන් මැඩම් ...” සිසුන් එක වරම හඬ නැගී ය.

“අලුත් පන්තියට හැමෝම පිළිගන්නා...හැබයි...පන්තියට ආවා වගේ නෙමෙයි වැඩ ටිකත් හොඳට ම කරන්න ඕන. ඒ වගේම තමා නවය වසරේ ලොකු අක්කලා හැටියට, පොඩි පන්ති වල  නංගිලා ට ආදර්ශමත් වෙන්න ඕනේ. ඒ කියන්නේ....අංක එක විනය.ගැහැනු ළමයෙක් විදිහට...”

“මේ..අපිට මුළු අවුරුද්දේ ම බණ අහන්න වෙයි වගේ...”කසුනිගේ කනට ළං වෙමින් සජනි කීවේ,නොකමැත්ත ප්‍රකාශ කරමිනි.

අඩ හෝරාවක ට ආසන්න ව පැවැත්වූ කතාව අවසන් කිරීමට ගුණරත්න ගුරුතුමිය ට සිත නොදුන්නද, පලමු කාලච්ඡේදයේ කාලය මිනිත්තු 40 ක් පමනක් වන බැවින් ඇය අවසානයේ දී තම කතාවට තිත තැබුවා ය. නමුත්, ශිෂ්‍යාවන් ට සිතුණේ එය තිතක් නොව කොමාවක් බවය. “පලවෙනි දවසේ මෙහෙම නම්, ඉස්සරහට මොනවා වෙයිද?” මෙය සෑම සියලු දෙනාගේම සිතෙහි ඇති ප්‍රශ්නාර්ථයයි. කෙසේ වෙතත් ගුණරත්න ගුරුතුමිය උගන්වන පාඩම් පැහැදිලි ය.ඇය කසුනිගේ පන්ති භාර ගුරුතුමිය මෙන්ම විද්‍යාව විෂය භාර ගුරුතුමිය ද විය.

විවේක කාලයට අමතර ව ඉසුඹුවක් නොලැබුණු කාර්යබහුල දිනයක් ලෙස ගෙවුණු නව වන ශ්‍රේණියේ පලමු දිනය වෙහෙසකර වුවත් ඉතා අගනේය.

• • •

පසුදා පාසල වෙත පැමිණි කසුනි, යෙහෙළියන් සමඟ සතුටු සාමීචි කතා බහේ යෙදෙමින් වැඩ කටයුතු ඇරඹුවා ය. ගුණරත්න ගුරුතුමියගේ විද්‍යාව කාලච්ඡේදයත් සමඟ ආරම්භ වූ අඟහරුවාදා දිනයේ,  හතර වෙනි කාලච්ඡේදයෙන් පසුව විවේක කාලය එළඹිණි.

සතර දෙනාම තම දිවා ආහාරය රැගෙන මේසයක් වටා රොක් වූහ. පලමුව, සජනිගේ කෑම පෙට්ටිය විවෘත විය.

"පොලොස් ඇඹුලයි, ගොටුකොළ මැල්ලුමයි, පරිප්පු බැදුමයි, හාල්මැස්සො බැදුමයි... හොඳටම ගැලපෙනවා." තොල කට ලෙව කමින් දිනිති ආහාර ගැනීම ඇරඹීය. සියල්ලෝම සතුටින් ආහාර ගත්තෝය. විවේක කාලය අවසානයටත් ප්‍රථමයෙන් ආහාර සියල්ල අහවර විය.

"අපේ අම්මලා කියන කතාවෙත් ඇත්තක් තියෙනවානේ?" කසුනි තම කෑම පෙට්ටිය බෑගය තුළට දමා ගනිමින් ම ඇසුවා ය.

"මොන කතාවද?" මිතුරියන් තිදෙනාම ප්‍රශ්නය නැගුවේ එකටමය. "වෙන මොකක් ද ඉතින්, අපේ කටවල් මැෂින් වගේ කියන කතාවයි, අපේ බඩවල් ටැංකි කියන කතාවයි." කසුනි සිනාසෙමින් ම කීවා ය.

"හැබැයි, ඒ ටැංකි ලේසියෙන් පිරෙන්නේ නෑ." දිනිති එයට යමක් එක් කළා ය.

අනෙක් තිදෙනාම සිනහ විය.

"ඒ වගේම...කොච්චර...කෑවත්...අපේ...ඇඟවල්...කෙට්ටු යි..." සදනි සිනහ වෙමින් ම වදන් පෙලක් එක් කළාය.

● ● ●

"අම්මේ මං ආවා..." නිවසේ දොර ඇරගෙන පැමිණි කසුනි, පාසල් බෑගය සෝපාව මතින් තබා...නිවස පුරා පැතිර තිබෙන බැදෙන තෙල් සුවඳ සොයගෙන මුළුතැන්ගෙය වෙත ගියාය.

"ආවා ද පොඩ්ඩී? මං මේ පරක්කු මොකද බලන්න පාරට යන්න කියලා බැලුවේ..." මව මුළුතැන්ගෙයි සිට ම ඇසුවා ය.

“ඔව් අම්මා…අද හොඳටම ට්‍රැෆික් … මොනවද අම්මා කරන්නේ?”

මුළුතැන්ගෙය ට පිවිසෙමින් ම කසුනි තම මවගෙන් ඇසුවා ය.

“මං මේ හවසට කන්න මුරුක්කු වගයක් බදිනවා.ඔයා ඒවාට හරි ආසයි නේ…” තෙලේ බැදෙමින් තිබුණු මුරුක්කු කිහිපයක් තාච්චියෙන් බාමින් සිටි මව පැවැසුවා ය.

“අම්මා…එහෙනම්, හෙට මට ඉස්කොලේ ගෙනියන්නත් ටිකක් වෙන් කරන්නකෝ.” කසුනි මුරුක්කුවක් චර චරස් ගා හපමින්ම කීවාය. මව ඊට සිනහවකින් පිළිතුරු දී නැවැතත් තම රාජකාරිය වෙත අවධානය දුන්නා ය. ඇඟ පත සෝදාගෙන දිවා ආහාරය ගත් කසුනි තම ප්‍රියතම ස්ථානය වන ගෙවත්තේ පිනි මල් ගස යට ඇති බංකුව වෙත ගියාය. එහි හිඳගෙන පාඩම් වැඩ අවසන් කල පසු, හෝරාවක ට ආසන්න කාලයක් කතන්දර පොත කියවූ ඇය, ඇදිරි වැටීමට ප්‍රථම ව මල් නෙළා ගත්තාය. සවසට මල් පහන් පූජා කොට බුදුන් වැඳීම ඇය නොවරදවාම සිදු කලාය.

• • •

“අම්මා මං යනවා…”මවගේත්, පියාගේත් දෙපා නැමැඳ පියාත් සමඟ පාසල් බස් රථය වෙත යාමට දොර අසලට යමින් කසුනි කීවා ය.

“බුදු සරණයි පොඩ්ඩී…පරිස්සමින්…” මව කීවා ය. අද බාලදක්ෂ ඉන්නවනේ. කෑම එක බෑග් එකේ ඇති, තව මුරුක්කුත්.යාළුවන්ටත් දීල කන්න එහෙනම්…” අම්මා කීවා ය.

“හරි අම්මා…” කසුනි පියාත් සමඟ පාරට යාමට එළියට පැමිණියා.

• • •

“ I.C.T මැඩම් කිව්ව කතාව නියමයිනේ…” පරිගණකාගාරයේ සිට නැවතත් පංතිය වෙත පිය නගිමින් දිනිති, තම මිතුරියන් තිදෙනා ඇමතුවා ය.

“මං පොත්වල කියවලා තියෙනවා තව අන්තර්ජාලයේත් මං හොයලා බැලුවා. ඒවගෙ තිබ්බ  විදිහට අමෙරිකාව වගේ තාක්ෂණය අතින් වගේම ආර්ථික අතිනුත් ගොඩක් දියුණු රටවල් වල දැනටමත් කෘත්‍රිම බුද්ධිය (AI) ,රොබෝ තාක්ෂණය භාවිතා කරලා ලොකු ලොකු නිර්මාණ කරලා තියෙනවා,කරමින් පවතිනවා. IT මැඩම් කිව්වා වගේ ම මේ ලෝකෙම රොබෝවරු පිරුණු  ලෝකයක් වෙනවා කියලා තමා ලෝක විචාරකයෝ කියන්නේ. ඇත්ත තමයි. ලෝකේ කොහොමත් ගොඩක් දියුණු වෙනවා. මේ..ඔයාල දන්නව ද තව අවුරුදු 100 කින් විතර කන්න කෑම වෙනුවට වෙන වෙන දේවල් නිපදවන වලු.  ඔන්න ඔය වගේ ගොඩාක් තොරතුරු හොයනවා නම්, ඕන තරම් හොයන්න පුළුවන් …” සෑම විටම දාර්ශනික ව සිතන මෙන්ම මිතුරියන් අතර බහුශ්‍රැත ම ගැහැණු ළමයා වන සජනි පැවැසුවාය.

“මාත් අහලා තියෙනවා…”දැනුනු අපහසුතාව මග හැරීමට අනෙක් තිදෙනාත් එක වරම පැවැසූහ.

“හරි හරි.. දැන් ඔය කතාව පැත්තකින් තියමු කෝ.” කතාව වෙනතකට යොමු කිරීමෙහි ලා සදනි පැවැසුවාය.

“ඔව් අනේ… තව අවුරුදු 100 කින් වෙන දේවල් ගැන හිත හිත ඉන්නේ නැතුව, අද දවසේ ජීවත් වෙමු කෝ… කොහොමත් ඉතින් අපි ඕවා ඔහොම වෙද්දී ඉන්නේ නෑනේ… එහෙනම් අපි අමරණීය වෙන්න එපැයි නේ…” කසුනි කීවාය.

“ඔව්…ඒකත් ඇත්ත…” දිනිති කීවා ය.

● ● ●

“අද බාලදක්ෂ ඉන්නවනේ ඔයාලා?” කසුනි තම මිතුරියන් ගෙන් ඇසුවාය.

“ඔව්.විශේෂ පණිවිඩයක් කියන්න තියෙනවා කියලා කිව්ව නිසා ඉන්න ඕනේ නේ…” සදනි කීවාය.

“අපි හැමොටම කන්න කියලා අම්මා රස කැමකුත් දුන්නා.” කසුනි, බෑගය ට අත දමමින් පෙරදා අම්මා සෑදූ මුරුක්කු තිබෙන මල්ල සොයමින් කීවාය.

“මුරුක්කු කකා ඉන්න වෙලාවක් නෑ… යමු යමු…පරක්කු වෙනවා..

මුරුක්කු පස්සේ කන්න පුළුවන් නේ…” සජනි අනෙක් තිදෙනාවම ද අතින් ඇදගෙන බාලදක්ෂ කාමරය වෙත ගියාය.

ඒ වන විටත් බාලදක්ෂ ගුරුතුමිය පැමිණ සිටි බැවින්, සිව්දෙනා හෙමින් සීරුවේ අසුන් ගත්තෝය.

“බාලදක්ෂිකාවනි..”ගුරුතුමිය හඬ අවදි කළාය.

“මෙම වසරේ පලමු බාලදක්ෂ කඳවුර ලෙස, ලබන සතියේ සිකුරාදා දිනයේ එනම් ජනවාරි මස දහවැනි දින, කඳුකර ප්‍රදේශය තුළ කඳවුරු බැදීමට ,බාලදක්ෂිකා සංගමය වන අප තීරණය කර ඇත. ඒ සඳහා සහභාගි වීම ට, දෙමාපිය කැමැත්ත හෝ අකැමැත්ත සඳහන් කර ලියුමක් ජනවාරි මස හය වැනි සඳුදා දින වන විට අප වෙත ලැබීමට සලස්වන්න.” බාලදක්ෂ භාර ගුරුතුමිය එම පණිවිඩය ලබා දී හෝරාවක ට පමණ පසු, සියලු ම බාලදක්ෂිකාවෝ විසිර ගියහ.

“අනේ…හරිම ෂෝක් නේ..මං හරිම ආසාවෙන් හිටියේ කැම්පින් ගහන්න යන්න.” එම නිවේදනයෙන් පසු ඉහේ මලක් පිපී සිටි දිනිති සතුටට උඩ පනිමින් කීවාය.

• • •

“අම්මා…”

“හ්ම්…”

“ බාලදක්ෂ මැඩම් කිව්වා. අපිව කෑම්පින් එක්ක යනවා කියලා. “ කසුනි අවසානයේ කතාවට මුල පිරුවා ය.

“ඔයාලත් ඇඹිලි ගැන ගැන නේ හිටියේ…” මල් පැළවලට වතුර දමමින් සිටි මව කීවාය.

“ඔව් අම්මා… කඳු පැත්තේ තමයි යනවා කිව්වේ.”

“දැන් කවදාද යන්නේ?”

“යන්නේ නම් ජනවාරි දහය, ඒ කියන්නේ ලබන සිකුරාදා. මැඩම් කිව්වා යනවා ද නැද්ද කියලා ලියුමක් ගේන්න කියලා.”

“හරි… එහෙනම් ඔන්න මං අවසර දෙනවා. මේ මල් පැළ ටිකට වතුර දාන්නකෝ..” මව එසේ කියමින් නිවස වෙත ගියාය

සතුටින් ඉපිලී සිටි කසුනි,මල් පැළවලට වතුර දමමින් කඳවුරු බැඳීම පිලිබඳ ව සිතමින් සිටියා ය.

• • •

හයවෙනි සඳුදා දින පාසලට පැමිණි මිතුරියන් සිව්දෙනා ම අත ලියුම් කඩදාසිය බැගින් තිබුණි. සියලු දෙනාම සතුටින් සිටියෝය.

විවේක කාලය තුළදී බාලදක්ෂ ගුරුතුමිය සොයා ගොස්, ලියුම් කවර සතර ලබාදුන් මිතුරියන්, නැවැත පන්තිය වෙත පැමිණියෝ ය.

“මට නම් කියන්න වචන නෑ. දවස් තුනක් කැලේක, අම්මලාත් නැතුව තනියම, ගිනිමැලය ක් වටේ සින්දු කියලා විනෝද වෙන්න...” සඳනි කඳවුරු බැඳීම ගැන සිත සිතා කියාගෙන කියාගෙන ගියාය.

“ඇයි අනේ... ඒ වගේද කූඩාරමක නිදාගන්නත් පුළුවන්නේ...” දිනිති කීවා ය.

“තව...කඳු නගින්නත් තියෙනවා.” කඳු නැගීම කෙරෙහි ඇල්මක් දැක්වූ කසුනි කීවාය.

“තව ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් වගේ දේවල් එහෙමත් තියෙනවා.” කුමන ස්ථානයක ට ගියත් අධ්‍යාපනය ට දැඩි සේ ඇලී සිටින සජනි කීවාය.

● ● ●

“පොඩ්ඩී මොනවද අනේ ඔය කාමරේ පුරා හොයන්නේ?” කාමරය පෙරළමින් යමක් සොයමින් සිටි තම දියණියට කතා කල මව, කසුනිගේ කාමරය ට එබී බැලුවා ය. ඒ වන විටත් රෙදි කන්දකට යට වී සිටි කසුනි ව දුටු විට සිනා ගියද එම සිනහව මැඩ පවත්වා ගත් කසුනිගේ මව කෝපය මුසු මුහුණ ක් මවා ගත්තා ය.

“මං මේ... හෙට කැම්පින් යන්න බඩු ටික ලෑස්ති කරනවා.” හෙමින් සීරුවේ නැගිට ගත් ඇය මවට පැවැසුවේ, උදවුවක් බලාපොරොත්තු වෙනි.

“කෝ කෝ ඉන්න මං ලෑස්ති කරන්නම්. නැත්නම්, ඔයා ලෑස්ති කර ගන්නවා කෙසේ වෙතත් මුළු ගෙදරම උඩු යටිකුරු කරයි. මං එපැයි

නේ ඒවත් අස් කරන්න. දැන් පැත්තකට වෙලා මට පොඩ්ඩ ක් උදවු කරන්න." කසුනිගේ මව එසේ පවසමින් ඇඳ මත ඉඳගත්තා ය.

• • •

"ඔන්න මං ලෑස්ති යි" කසුනි, තම මිතුරියන් තිදෙනා ට  පැවැසුවා ය.

"අපිත් ලෑස්ති යි." සදනි කීවාය.

"කීයටද පිටත් වෙන්නේ?" දිනිති ඇසුවාය.

"අන්න මැඩම් එනවා. දැන් කියයි."සජනි ගුරුතුමිය ව දෑසින් ඉඟි කරමින් පැවැසුවා ය.

"සුබ උදෑසනක් වේවා. අද අපි මේ රැස් වෙලා ඉන්නේ, මේ අවුරුද්දේ පලවෙනි කඳවුරු බැඳීම හා එක් වීමට යි. ඒ සදහා කළුකර ප්‍රදේශය කරා ගමන, තව මිනිත්තු 15 කින් ආරම්භ කරනවා. එම නිසා සියලුම බාලදක්ෂිකාවන් බස් රථය ට ගොඩ වෙන්න. තම තමන්ගේ ගමන් මලු සියල්ල ම පසු පස අසුනේ තබන්න. ඒ සියල්ලම එක් එක් කණ්ඩායමේ නායිකාව විසින් වෙන් වෙන් කොට තබන්න." බාලදක්ෂ ගුරුතුමිය නිවේදනය ලබා දී නැවැතත් ජ්‍යෙෂ්ඨ බාලදක්ෂ නායිකාවන් සමඟ බාලදක්ෂ කාමරය වෙත ගමන් කලාය.

"අපේ නායිකාව කසුනි ඔයානේ. යමු යමු ගිහින් බෑග් ටික පිළිවෙලට වෙන් කරලා තියමු." සෑම විටම තම හොඳම මිතුරිය ගැන සිතන සජනි කීවාය.

"අපි තමයි ඕලු කණ්ඩායම. ඒක අඳුන ගන්න මං අපේ බෑග් ටිකේ ඕලු කණ්ඩායම කියලා ලේබලය ගානේ ඇලෙවුවා." සෑම විටම

නිර්මාණාත්මක ව මෙන්ම තැනට සුදුසු නුවණින් යුතුව කටයුතු කරන සදනි කීවාය.

• • •

ජනේලය අසල අසුනක් වෙන් කරවා ගත් කසුනි ඉඳගෙන ස්වභා සුන්දරත්වය නැරඹුවාය යෝධ සෙවණැලි මෙන් නැගී සිටි හරිත වර්ණ කඳුවැටිද ,නේකවිධ වර්ණයන්ගෙන් අලංකාරවත් වූ පුෂ්පයන්ද, විවිධ රටා මවන ලොකු කුඩා සියලුම සියොතුන්ද ,ආහාර සොයමින් ඇවිදින විවිධ සිව්පාවුන්ද,මග දෙපස මෙන්ම සමස්ත පරිසරයම අලංකාරවත් කරන්නේය. මෙසේ සොබාදහම් මාතාවගේ අපූර්වත්වය විඳිමින් දැහැනට සමවැදී සිටි කසුනි, එක්වරම තිගැස්සී ගියාය.ඒ කිසිවක් නිසා නොව දිනිති පැමිණ ඇයට තට්ටු කිරීම නිසාය.

“ මේ බලන්නකෝ... අනේ... අපේ කසුනි දැහැනකට සම වැදිලා. සමාවෙන්න,මම ඔබට බාධා කළා නම්.මම ඔබට කතා කළේ, තව ස්වල්ප වේලාවකින් අපි ගමනාන්තය වෙත ළඟාවන බව දැන්වීමට යි.” දිනිති මඳ සිනා පා නැවතත් තම ආසනය වෙත ගොස් හිඳගත්තාය. නමුත්,කසුනිට නැවතත් දැහැන්ගත වීමට නොහැකි විය.

කෙසේ හෝ අවසානයේදී ඔවුහු ගමනාන්තය වෙත ළඟා වූහ.

බස් රථයෙන් බැසගත් සියලුම බාලදක්ෂිකාවෝ කණ්ඩායම් අනුව කණ්ඩායම් නායිකාවන් පිටුපසින් පෙළගැසුණෝ ය.

අනතුරුව බසයෙන් බැසගත් තේ බාල දක්ෂ භාර ගුරුතුමිය ක් සියලුම බාරදක්ෂිකාවන් ඉදිරියට පැමිණ න්නේ අවශ්‍ය උපදෙස් ලබා දුන්නාය.

“ බාලදක්ෂිකාවන් වශයෙන් අපි මේ පැමිණ ගත කරනු ලබන කඳවුරු බැඳීමේ චාරිකාව ,හුදෙක් චාරිකාවකට පමණක් සීමා නොවී, අධ්‍යාපනික වශයෙනුත්, ඒවාගේම කඳු නැගීම වැනි විවිධ

ක්‍රියාකාරකම් වල නියැලෙමින් ශාරීරික වශයෙනුත් යෝග්‍යතාව පවත්වා ගනිමින්, මනස නිරවුල්ව,විනෝදයෙන් ගත කිරීමට මෙය අවස්ථාවක් කර ගත යුතුයි. බාල දක්ෂිකාවක් ලෙස සැම විටම අවට පරිසරය පිරිසිදුව තබා ගනිමින්, පරිසර මාතාවට ගෞරව කිරීමටත්, සියලුම දෙනා තරයේ මතක තබාගත යයුතුයි. අපි මේ පැමිණ සිටින වනාන්තරය කිසිසේත්ම අපවිත්‍ර නොකර, ඒ වාගේම වනාන්තරයේ ගැවසෙන අහිංසක සතා සිවුපාවා ට කරදර නොකර, තම තමන්ගේ විනෝදය උදෙසා පමණක් කටයුතු නොකර, අන් අය ගැනද සිතා බැලීම සිදු කළ යුතුයි. මෙම චාරිකාවේදී කණ්ඩායම් වශයෙන් විවිධ ක්‍රියාකාරකම් පවත්වයි. ඒ සඳහා සියලුම කණ්ඩායම් නායිකාවන් තම තමන්ගේ කණ්ඩායම් නිසි පරිදි සූදානම් කරගත යුතුයි. කිසිදු කණ්ඩායමක් තරගවලදී වංචා කිරීම හෝ විනය විරෝධී කිසිවක් සිදු නොකළ යුතුයි. දින තුනක් අප මෙම චාරිකාවේ යෙදෙන අතර, බාල දක්ෂිකාවක ලෙස වඩවා ගත යුතු ගුණාංග රැසක් මෙහිදී වර්ධනය කර ගැනීමට ඔබට හැකියාව ලැබේ. හෙට දින සිට කණ්ඩායම් තරග ආරම්භ වන බැවින්, දීර්ඝ ගමනක් පැමිණ සියලු දෙනාටම වෙහෙසකර බැවින් අද දින කූඩාරම් ගසා අවශ්‍ය දෑ සම්පාදනය කරගෙන,විවේක ගන්නා ලෙස දන්වා සිටිමි. හෙට දින සිට සියලුම දෙනා කණ්ඩායම් වශයෙන් උදෑසන පෙළ ගැසිය යුතුයි. කණ්ඩායම් නායිකාවන් තම කණ්ඩායමට එක කූඩාරම බැගින් සකසාගෙන අද දින විවේකයක් ලබා ගන්න.සියලුම දෙනා විසිර යන්න."

කසුනි, තම කණ්ඩායමද සමඟ ඕලු කණ්ඩායමට අදාළ කූඩාරම ගැසීමට සූදානම් වූවාය. අනෙක් කණ්ඩායම් වලට සාපේක්ෂව එකමුතුව කටයුතු කරමින්, ඉතා ඉක්මනින් කූඩාරම සාදා, අවශ්‍ය භාණ්ඩ ආදිය තැන්පත් කර , නිසි පරිදි කූඩාරම සකස්කර බැවින්, බාල දක්ෂ භාර ගුරුතුමියද කසුනි ඇතුළු කණ්ඩායමට ප්‍රශංසා කළාය.

දීර්ඝ ගමනක් පැමිණීම නිසා ගතට මහන්සියක් දැනුණු බැවින් සියලු දෙනාම වේලාසනින් නින්දට ගියෝය.

● ● ●

"හොඳට නින්ද ගියා නේද? හරි අමුතුම අත්දැකීමක්..." පාසල් යෑමටවත් උදෑසන අවදි වීමට අකමැති කසුනි අද හිමිදිරි පාන්දරම අවදිව සිටියේ සියලු දෙනාගේම නෙත්වලට අදහාගත නොහැකි ලෙසය.

" ඇත්තට ම හරිම අමුතු අත්දැකීමක්.මැඩම් කිව්වේ උදේම පෙළ ගැහෙන්න කියලා නේද? ඉක්මන් කරලා ලෑස්ති වෙලා එළියට යමු."

එසේ කියූ සජනි ඉක්මන් ගමනින් අනෙක් සොයුරියන්ද සමග සූදානම් වී පෙළ ගැසීම සඳහා පිටතට පැමිණියාය.

එදින කණ්ඩායම් ක්‍රියාකාරකම් වශයෙන් සිදු කිරීමට තිබුණේ, කඳු නැගීමයි. සියලු දෙනාම ඉතාමත් උද්යෝගීමත්ව කඳු නැගීමට යොමු වූහ.

"කණ්ඩායම මාත් එක්කම ඉන්න. අපි එකට හිටියොත් අපිට ඉක්මනට මේ වැඩේ ඉවර කරන්න පුළුවන්." කණ්ඩායම් නායිකාව වන කසුනි කීවාය.

බාලදක්ෂ ගුරුතුමියගේ සංඥාව ට ආරම්භ කල, කඳු නැගීමේ කණ්ඩායම් ක්‍රියාකාරකම ආරම්භ වුණි. අඩ හෝරාවක් යෑමටත් පෙර එම ක්‍රියාකාරකම සාර්ථකව නිම කළ ඕලු කණ්ඩායමට සියලු දෙනාගෙන් ම අත්පොළසන් නද ලැබුණි.

● ● ●

“ගිනි මැලයක් ගාව ඉඳගෙන මාෂ්මෙලෝස් කන එක නම් මගේ තිබ්බ හීනයක්…” එසේ කියමින් දිනිති මාෂ්මෙලෝස් කෑල්ලක් කටින් කඩා ගත්තා ය.

“හරි හරි… දැන් ඉතින් කොහොම හරි ඔයාගෙ හීනේ ඔය ඇස් ඉස්සරහ පිටම හැබෑ වෙලා තියෙන්නේ…” සඳනි දෑසින් ගිනි මැලය සහ මාෂ්මෙලෝස් ඉඟි කරමින්, දිනිති ගේ කර වටා අත දමමින් කීවාය.

සියලු දෙනාම ගිනි මැලය වටා රැස් වී, ගීත ගයමින්,මාෂ්මෙලෝස් කමින් විනෝද වුවා ය.

මධ්‍යම රාත්‍රීය ට ළඟා වූ පසු සියලුම දෙනා නින්දට ගියහ.

• • •

උදෑසන ම සියලු ම දෙනා ට පෙළ ගැසෙන්න ට සන් කල බාලදක්ෂ ගුරුතුමිය, සියලුම දෙනා පෙළ ගැසුණු පසු සැම දෙනා ම ඇමතුවාය.

“ අද දවසේ කණ්ඩායම් ක්‍රියාකාරකම  වශයෙන් ප්‍රශ්න විචාරාත්මක තරගයක් පැවැත්වීමට නියමිතය. එය සාමාන්‍ය දැනීම වගේම අධ්‍යාපනික ප්‍රශ්නද ඇතුළත්ව පවත්වනු ලබනවා. ජයග්‍රහණය කරනු ලබන කණ්ඩායමට පදක්කමක් ලබාදීමද සිදුකරනවා. සියලු දෙනාම සූදානම් වන්න.තරගය  උදෑසන 10 වන විට ආරම්භ වෙනවා.”

“ඇහුනද සජනි දැන් ඉතින් ඔයාගේ වැඩ පෙන්නන්න තමා තියෙන්නේ… කණ්ඩායම් තරගෙත් ඕලු කණ්ඩායමට වැඩිම ලකුණු ගන්න පුළුවන්.” එසේ කියූ මිතුරියෝ තරගය සඳහා සූදානම් වූහ.

• • •

එසේ අවසාන තරගයත් ජයග්‍රහණය කරමින් වැඩිම ලකුණු ප්‍රමාණයක් ලබාගත් ඕලු කණ්ඩායමට බාලදක්ෂ ගුරුතුමිය විසින් පදක්කම් පිරිනමනු ලැබීය.

" සියලුම බාරදක්ෂිකාවන්ට ආදර්ශයක් ලෙස ක්‍රියා කරමින් ඕලු කණ්ඩායම  මෙවර පළමු කඳවුරු බැඳීමේ චාරිකාවේ සියලුම කණ්ඩායම් ක්‍රියාකාරකම් ජයග්‍රහණය කරමින්,මේ ආකාරයට පදක්කම් ලබනවා. මම ඕලු කණ්ඩායමේ දැකපු හුඟාක් හොඳම දේ තමා  ඒ කණ්ඩායමේ හැම සාමාජිකාවක්ම ඉතාමත් සහයෝගයෙන් යුතුව, එකාවන්ව සියලුම ක්‍රියාකාරකම්වලදී  කටයුතු කළා.ඔවුන්ගේ ජයග්‍රහණය පිටුපස රහස විදිහට ඒ එකමුතුකම සමගිය හඳුන්වන්න පුළුවන්. ඉතින් බාරදක්ෂිකාවන් වශයෙන් ඔයාලත් එය ඕලු කණ්ඩායමේ බාදක්ෂිකාවන්ව ආදර්ශයට ගනිමින්,එකමුතුව මෙන්ම සහයෝගිතාවෙන් යුතුව  වැඩ කටයුතු සිදු කිරීමට වගබලා ගත යුතුයි. එසේ නම් ,සියලු දෙනාම අත්පොළසන් නාදයක් ලබා දී එම කණ්ඩායමට සුභපැතුම් පළ කරමු." බාලදක්ෂිකා භාර ගුරුතුමියත්, සියලුම බාල දක්ෂිකාවනුත් අත්පොළසන් නාදයක් ලබාදුනි.

" එසේ නම් අපි හෙට දින දහවල් 12 වන විට කඳවුරු සියල්ලම ඉවත් කරගෙන මෙම ස්ථානයෙන් පිටව යා යුතුයි. අද දින සියලු දෙනාම හවස් යාමය විනෝදයෙන් ගත කර, රාත්‍රියේ දී ගිනිමැලය  අසලට එක්වන්න."

• • •

පසුදා උදෑසන කසුනි,සජනි, දිනිති, සදනි යන සොයුරියන් හතර දෙනා ම කඳුකර චාරිකාවේ අවසාන දිනය වන බැවින් ,උදෑසන වටපිටාවේ සිරි නැරඹීමට යාමට තීරණය කරන ලදී.

සියලු දෙනාම වටපිටාවේ ඇවිදිමින් සිටියෝය. ඒ අතර වාරයේ දිනිති දිය ඇල්ලක් අසල නැවතුනාය. එවිට ඇය අමුතුම දර්ශනයක් දුටුවාය. දිය මතුපිටින් ඇගේ ප්‍රතිබිම්බය සම්පූර්ණයෙන්ම වෙනස් ආකාරයකට දිස්විණ. ඇය හැඳ සිටි බාලදක්ෂිකා නිල ඇඳුම වෙනුවට, දිය මතුපිටින් ඇය ඇඳ සිටියා යැයි  පෙනුනේ අමුතුම ආකාරයේ නවීකරණය වූ ඇඳුමකි.

“කසුනි,සජනි,සදනි තුන්දෙනාම එන්නකෝ.. මේ බලන්නකෝ..”

යහළුවාගේ කෑගැසීම ඇසී තිදෙනාම ඉක්මනින් ම දිය ඇල්ල අසලට රොක් වූහ.

“ඇයි මොකද උනේ ?ප්‍රශ්නයක් ද?”කසුනි ඇසුවාය.

“ නෑ ප්‍රශ්නයක් නම් නෙවෙයි. මේ බලන්නකෝ...” දිනිති ඇගේ ප්‍රතිබිම්බය පෙන්නමින් කීවාය. තිදෙනාම ගල්ගැසුණු ආකාරයට බලා සිටියෝය. සොයුරියන් සිව් දෙනාම පෙනුනේ ඉතාමත් නවීකරණය වූ ගැහැණු ළමුන් හතර දෙනකු ලෙසිනි.

“අපි පොඩ්ඩක් මේ වතුර අල්ලලා බලමුද?”සජනි එකපාරටම ඇසුවාය.

“ අනේ මන්දා කෝකටත් ඔය බලමුකෝ... අපේ ඇස්වල ප්‍රශ්නයක්ද දන්නෙ නෑ නේ...” සදනි සිනාසෙමින් කීවාය. සිව් දෙනාම එකවර දිය ඇල්ලේ වතුරට අත තැබූවෝය.

● ● ●

ඉතාමත් සුන්දර පාරාදීසයකි. නමුත් කිසිවක් ස්වභාවික සුන්දරත්වයෙන් යුතු වූයේ නැත.සියල්ලම කෘතිමව සැදුණු ආකාරයට

වර්ණ ගැන්වී ඇත. මල්,ගස් වැල් සියල්ලම තිබුණද,ඒවා කිසිවක් අප අත්දකිනවා මෙන් ස්වභාවිකව සැදුණු ඒවා නොවෙයි. මල් වලින් සුවඳක් හමුවේ නැත. කිසිවක් සෙලවුනේවත් නැත .සියල්ලම එකම ආකාරයකට නොසෙල්වී පැවතිණි. සත්වයන් පවා ද අප සාමාන්‍යයෙන් අත්දකිනවා මෙන් ලොම් සහිත ,මස් සහිත සතුන් නොවේ. සියල්ලම කෘතිමය. කුමක්ද මේ ලෝකය?

සදනි,කසුනි,සජනි හා දිනිති සිටි තැනම ගල් ගැසි බලා උන්හ. ාං කුමක්ද මේ එකපාරටම සිදුවූයේ ?

සැම විටම බහුශ්‍රැත, ඒවාගේම බුද්ධිමත්ව කටයුතු කරන සජනිත් නිහඬ.

" ඇත්තටම අපි මේ කොහෙද ඉන්නේ? මොකක්ද ඇත්තටම වුනේ?" කසුනි ඇසුවාය.

අපි දිය ඇල්ලේ වතුර අල්ලපු ගමන් නේද මේ වගේ දෙයක් වුනේ?" සදනි කීවාය.

" අපි හැමෝගෙම ඇඳුම් වෙනස් වෙලා. හරියට අපි වතුරෙ දැක්කා වගේ. එහෙම වුණේ කොහොමද?" කුතුහලයෙන් පිරි දෙනෙතින් යුතුව මිතුරියන් තිදෙදෙනා දෙස බලා දිනිති පැවසුවාය.

"ඒකනං ඇත්ත තමා. බලන්නකෝ... අපි හැමෝගෙම අතේ තියෙනවනේ ඔරලෝසුවක්. අනික ඒකෙ කටු කැරකෙන්නෙත් අනිත් පැත්තටනේ." සැම විටම වටපිටාව පිළිබඳව විමසිලිමත් වන සජනි සැම දෙනා දෙසම බලා පැවසුවාය.

එවිටම මිනිසුන් මෙන් පෙනුනද ඇස් පිල්ලම් ගැසීමක් හෝ කිසිදු ආකාරයක මිනිස් දේහ චලනයක් නොපෙන්වන ජීවි කොට්ඨාසයක්, මෙම මිතුරියන් සිව් දෙනා අසලට පැමිණියහ.

"පිළිගන්නවා හැමෝම. බය වෙන්න ඕනේ නෑ. අපි අපේ අමුත්තන් ට සලකන්න දන්නවා. අපි රොබෝවරු, අපි ව හදලා තියෙන්නේ කෘත්‍රිම බුද්ධිය (AI) පාවිච්චි කරලා." එක් අයෙක් ඉදිරියට පැමිණ සියලු දෙනාම පිළිගත්තේ ය.

මිතුරියන් තිදෙනාගේ තිබුණු කුතුහලය තව තවත් වර්ධනය විය.

**එතකොට අපි මේ ඉන්නේ අනාගතයේ ද?**

● ● ●

"මගේ නම ඇනෙක්සි ටූ සීරෝ ටූ (202). මං දැන් ඔයාලට කියලා දෙන්නම් මොකක්ද සිද්ධ වෙන්නේ කියලා." එක් රොබෝ ගැහැණු කෙනෙක්, මිතුරියන් සිව්දෙනා ව ත් කැටුව ගමන් කළේය.

"අපි මේ ඉන්නේ 2100 අවුරුද්දේ...ඉතාමත් නවීකරණය වී ඇති කාලයක් තමයි ඔයාලට දැන් දැකගන්න තියෙන්නෙ"

"එක්ස්කියුස් මී ඇනෙක්සි ටූ සීරෝ ටූ, එතකොට මෙහෙ එකම එක මිනිහෙක් වත් නැද්ද?" කුතුහලය පිරි දෙනෙතින් යුතුව එම ප්‍රශ්නය ඇසුවේ, සඳනි ය.

"මිනිස්සු? දැන් මිනිහෙක් හොයාගන්නවත් නෑ. හැමෝම රොබෝවරු මිනිස්සු නෑ."

"අපි මෙහෙට ආවේ අහම්බෙන්, එතකොට අපි ආයේ යන්නේ කොහොමද?" බිය නොපෙන්වමින් දිනිති ඇසුවා ය.

"බය වෙන්න කිසි දෙයක් නෑ. ඔයාලගෙ ඔය අතේ තියෙන ඔරලෝසුවේ පැය කටුව දැන් තියෙන්නෙ 12 නේ.අන්න ඒ කටුව වට

දෙකක් ඒ කියන්නේ පැය 24 ක්, කැරකිලා ඉවර වුණාම ඔයාලා ඉබේම, ඔයාලා හිටපු තැනින්ම මතු වෙනවා."

"සමාවෙන්න, අපිට දවසක් මෙහෙට වෙලා ඉන්න බැහැ. අද අපි කඳවුරෙන් 12 වෙද්දී පිටත් වෙනවා." සජනි කීවාය.

"ආ...මට කියන්න අමතක වුණා. පැය 24 ක් කියන්නේ මෙහෙ දවස් දෙක ක්."

එය ඇසූ පසු සැම දෙනාටම උන් හිටි තැන් අමතක විය.

"මෙහෙ දවස් දෙකක් උනත් එහෙ පැය දෙකක කාලයක් විතරයි ගෙවන්නේ. මෙහෙ කාලය වේගයෙන් ගෙවෙනවා. දවසක් කියන්නේ මෙහෙ පැය 12 යි. ඒක එහෙ ගෙවන්නේ පැයක් හැටියට."

එයින් පසුව සියලු දෙනාගේම ඇගට ලේ ටිකක් ඉනුවේ ය.

"එතකොට මෙහෙ දිනයකට පැය 12 යි හැබැයි ඒක එහෙ ගෙවන්නේ විනාඩි 60 යි,එතකොට මෙහෙ කාලය ගමන් කරනවා වේගවත්. එතකොට අනාගතේදී කාලය වේගෙන් ගමන් කරනවා." සජනි උනන්දුවෙන් සිතුවා ය.

● ● ●

මඳ වේලාවකට පසු, මිතුරියන් තිදෙනා ද කැටුව, රොබෝවරිය ඔවුන්ගේ ලෝකය පෙන්වා දීම ආරම්භ කළාය. විවිධාකාර ගොඩනැගිලි පසු කරමින් ගිය ඔවුන්ට,ඇය විසින් එක් ස්ථානයක නවතින ලෙස දැක්වූවාය.

"ඔයාලට බඩගිනි ඇති නේ...එන්න මාත් එක්ක." රොබෝවරිය පෙරමුණ ගෙන අවන්හලක ට පිය මැන්නා ය.

“මට නම් යකෙක් කන්න බඩගිනි යි. “සැම විටම කෑම ට කෑදර වූ දිනිති පැවැසුවාය.

නමුත්, මෙම අවන්හල තුළ, වෙනත් අවන්හල් වල මෙන් ආහාර පාන වර්ග තිබුණේ නැත. මෙහි තිබුණේ අමුතු ආකාරයේ ආහාර ය.

බෝංචි ඇටයක් වැනි ඇටයකට කුමක්දෝ ද්‍රව බිංදුවක් එක් කල විට විවිධ ආකාරයේ ආහාර මතු විය. ආහාර ගැනීම ට තිබූ අවශ්‍යතාව පහව ගියද, රොබෝවරිය අමනාප කර නොගත යුතු බැවින් එම ආහාර සියලු දෙනාම අනුභව කළහ.

නමුත්, මෙම ආහාර ප්‍රමාණය දිනිති ගේ කටටවත් නොසෑහේ.

තව කුමක් හෝ කන්නට සෙවූ ඇයගේ නෙත ගැටුණේ විස්කෝතු කිහිපයකි. එයින් එකක් මිලදී ගත් ඇය, එය සැපුවා පමණි. එසේ හැපූ කොටස නැවැත මතුවිය. ඇයට අදහාගත නොහැකි විය.

“මේ විස්කෝතු ව කොච්චර කෑවත් ඉවර වෙන්නේ නෑනේ.” තම මිතුරියන් හට විස්කෝතු ව පෙන්වූ දිනිති පැවැසුවාය.

එය නැවැත ලබාදෙන ලෙස පැවසුවත්, දිනිති එය තම සාක්කුවේ දමාගත්තා ය.

**සැබෑවටම එය ඉවර නොවෙන විස්කෝතුවක්!**

● ● ●

“ ඔයාලා මෙතන විවේක ගන්න. හෙට කතා කරමු.”රොබෝවරිය අපට නවාතැන් ගැනීමට සුඛෝපභෝගී නිවසක් පෙන්වා,පිටත් ව ගියාය.

“මේ කැම්පින් ට්‍රිප් එක තමයි හොඳම එක.” යැයි කියමින්, මිතුරියෝ සියලු දෙනාම අත් අල්ලන් උඩ පැන්නෝ ය.

“මට හරි මහන්සියි අනේ.දැන් නිදා ගමු.” කසුනි ඈනුමක් අරිමින් කීවාය.

සියලු දෙනාම නවීකරණය වී ඇති ඇඳන් මත නිදා ගත්තෝය.

• • •

පසුදා උදෑසන ම අවදි වී, උදෑසන ආහාරය ලබා ගත් මොවුන්, නිවසින් පිටතට පැමිණියෝය.

“එන්න,.අද ගොඩාක් දේවල් ඔයාලට බලන්න පුළුවන්.” රොබෝවරිය මිතුරියන් සිව්දෙනා කැටුව සැනකෙලියක් වෙත යමින් කීවා ය.

විවිධ අන්දමේ විනෝද ක්‍රීඩා රැසකින් සමන්විත වූ එම සැණකෙලිය, ඉතා සුවිශේෂී ය. එහි සෑම විනෝද ක්‍රීඩාවක්ම තාක්ෂණික වශයෙන් ඉතාමත් දියුණු ඒවා විය.

උදෑසන සහ දවල් කාලය ත් සැණකෙලිය තුළ ගත කළ සියලුම දෙනා, අවසානයේ තම දිවා ආහාරය ගැනීමෙන් අනතුරුව, නැවතත් නවීකරණය වූ ඔවුන්ට ලබා දුන් නිවාසය වෙත ට ගියෝය.
“අනිවාර්යයෙන්ම හවස තියෙන සංගීත සංදර්ශනයට ඔයාලා හැමෝම එන්න ඕනේ... මොකද, මමත් ඒකේ සින්දු කියනවා.” රොබෝවරිය ඉතා සතුටින්, කසුනි, සජනි,දිනිති හා සඳනිට ආරාධනා කළාය.

“ අපි අනිවාර්යෙන්ම එනවා ඔයාගේ සින්දු අහන්න අපි හරි ආසයි.” එසේ කියූ සොයුරියන් සිව්දෙනා ට අත වනා සමුගත් රොබෝවරිය නැවතත් පිටව ගියාය. අනතුරුව සියලු දෙනාම පිරිසිදු වී, රූපවාහිනිය නරඹමින් දහවල් කාලයේ ඉතුරු හෝරා කීපය ගත කළෝය.

• • •

“ ඔව් අද,සන්ධ්‍යාව විචිත්‍රවත් කරමින් පළමු ගීතය ගායනා කරන්නේ,ඇනෙක්සි වූ සීරෝ වූ... සියලු දෙනාම අත්පොළසන් නාදයක් ලබාදෙන්න මේ ඇනෙක්සි වූ සීරෝ වූ...”

සියලු දෙනාගෙම අත්පොළසන් නාදය මැද වේදිකාවට පිවිසි රොබෝවරිය දෙස මිතුරියන් සියලු දෙනාම බලා සිටියෝය.

“අනේ ... එයා හරි ලස්සනට සින්දු කියනවනේ.” කසුනි කීවාය.

“ඒක තමයි නේද...” අනෙක් තිදෙනා කීහ.

මධ්‍යම රාත්‍රිය වන තෙක් පැවති සංගීත සන්ධ්‍යාවෙන් අනතුරුව නැවතත්, සියලු දෙනාම නිවස වෙත ගියෝය.

“හෙට අපිට ආයෙත් කඳවුරට යන්න පුළුවන් වෙනව නේද?” කලස්සල්ලෙන් යුතුව දිනිති පැවසුවාය.

“ඔව් නේ...මේක ලස්සන තැනක්. ඒත් ඉතින් අපිට මෙහෙ හැමදාම ඉන්න බැනේ. කමක් නෑ...අපි මේ හිටපු දවස්වල ගොඩක් විනෝද වෙලා, ගොඩක් දේවල් ඉගෙන ගත්තනේ.”සජනි කීවාය.

• • •

පසුදා උදෑසන අවදි වූ මිතුරියන් සිව් දෙනා ම අවසාන වශයෙන් දැකගැනීමට,රොබෝවරිය පැමිණියාය.

“දැන් ඔයාලගේ ඔරලෝසුවේ පැය කටුව හරියටම එකොළහේ තියෙන්නේ.තව විනාඩි පහකින්,ඔයාලට ආපහු ඔයාලා හිටපු කඳවුරෙන්ම මතුවෙන්න පුළුවන්.” රොබෝවරිය දුක්බර හඬකින් පැවසුවාය.

“ඔයාට ගොඩක් ස්තූතියි අපිට මේ දවස් දෙකේ ගොඩක් දේවල් කියලා දීලා,විනෝදයෙන් තිබ්බට. ඔයාව කවදාවත් අමතක වෙන්නේ නෑ.” යෙහෙළියන් සිව් දෙනාම එසේ කියමින්, කඳුළු පිරි දෙනෙතින් යුතුව රොබෝවරියව  වැළඳ ගත්තෝය.

“අපි එහෙනම් ගිහින් එන්නම්.ඔයත් පරිස්සමින් ඉන්න.” මිතුරියෝ සිව් දෙනා ම අත වනමින් රොබෝවරියට පැවසුවෝය.

• • •

“කසුනි, දිනිති ඔයාලා ඔක්කොම කොහෙද ගියේ? අපි කොච්චර ඔයාලව හෙවුවද?පැය දෙකක් තිස්සේ..”බාලදක්ෂ නායිකාවක් ඔවුන් සිව් දෙනා අසලට පැමිණෙමින් කීවාය.

“අනේ නෑ අක්කේ... අපි මේ පොඩ්ඩක් වටපිටාවේ ඇවිදලා බැලුවා.” කසුනි කීවාය.

“ හරි හරි දැන් ඒකට කමක් නෑ. එන්න ඉක්මන් කරලා ගිහිල්ලා ඔයාලගේ බඩු ටික පැක් කරගන්න. දැන් අපි යන්න ලෑස්ති වෙන්නේ” බාලදක්ෂිකා නායිකාව නැවතත් කඳවුර වෙත ට, ඔවුන් සිව්දෙනා ව රැගෙන යමින් පැවසුවාය.

• • •

“අම්මා ඔන්න මං ආවා.” පියාගේ කාරයෙන් බැසවිත්, නිවසට ඇතුළු වූ කසුනි කීවාය.

“ආ...මේ ඉන්නේ අපේ බාල දක්ෂිකාව. කොහොමද ඉතින් කැම්පින් ට්‍රිප් එක?” අම්මා ඇසුවාය.

“ කියන්න වචන නෑ අම්මා…මාරයි.” කසුනි උඩ පනිමින් කීවාය.

• • •

“ හෙලෝ කවුද මේ?” කසුනිගේ මව දුරකථනයෙන් ඇයට ඇමතූ පුද්ගලයාගෙන් ඇසුවාය.

“ඇන්ටි මේ මම.සජනි. මට පොඩ්ඩක් කසුනිට කතා කරන්න පුලුවන්ද?” දුරකථනයේ මද වේලාවක් රැදී සිටි සජනිට, අවසානයේ කසුනිගේ හඬ ඇසුණි.

“ඔව් සජනි, කියන්න.”කසුනි කීවාය.

“ කසුනි, ඔයාට අද හවස වැඩක් නැත්නම්, පාක් එකට එන්න පුළුවන්ද? අපි හැමෝම එනවා.පොඩි වැදගත් දෙයක් කියන්න තියෙනවා.” සජනි කීවාය.

“ හරි මං එන්නම් කසුනි කීවාය.”දුරකථනය විසන්ධි විය.

• • •

මිතුරු පිරිස එදින සවස හතර පමණ වන විට උද්‍යානයේදී රැස් වූහ.

දිනිති, ප්‍රීතිමත් ව සොහොයුරියන් දෙස බැලුවා ය.

“මොකක්ද අද අපි මේ රැස් වෙන්න හේතුව?” කුතුහලයෙන් පිරි දෙනෙතින් යුතුව සදනි ඇසුවාය.

“නෑ මේ. දිනිති කිව්වනේ එයාට  වැදගත් දෙයක් කියන්න තියෙනවා කියලා. ඒකයි මං ඔයාලට ත් එන්න කිව්වේ.” සජනි කීවාය.

“හරි එහෙනම් කියන්නකෝ දිනිති.”කසුනි කීවාය.

දිනිති තම සාක්කුවට අත දමා යමක් පිටතට ගත්තාය.

සියලු දෙනාම ගල් ගැසී බලා සිටියෝය.

"මේ තියෙන්නෙ ඉවර නොවෙන විස්කෝතු ව" දිනිති කීවාය.

"ඔයා ඒක ගෙනාවා ද?" සජනි ඇසුවාය.

"ඔව් ඉතින් මන් ඒක ගෙනාවා. ඔයාලා තියන්න කිවුවට, මං ඒක සල්ලි දීල නේ ගත්තෙ.එතකොට මේක හොරකමක් නෙමෙයි." දිනිති කීවාය.

"මේක අපි තියාගන්නේ නැතුව කෞතුකාගාරය ට භාර දෙමු." කසුනි කීවාය.

"ඔව් ඒත්, අපි දියඇල්ලෙ කතාව කියන්නේ නැතුව ඉමු." සදනි කීවාය.

"ඔව්. ඇනෙක්සි අපිට කිව්වෙත් කියන්න එපා කියලා නේ."කසුනි කීවාය.

• • •

මිතුරියන් සිව්දෙනා විස්කෝතු ව ගෙන ගොස් කෞතුකාගාරය ට ලබා දුන්නෝ ය. කෞතුකාගාරයේ පාලක තුමන් විසින් එය පරීක්ෂණ සඳහා විද්‍යාගාරය වෙත යොමු කරන ලදී.

විද්‍යාඥයෝ,මෙම විස්කෝතුව අති විශිෂ්ට තාක්ෂණයකින් සාදා ඇති බවත්, එය විවිධ රසායනික ද්‍රව්‍ය උපයෝගී කරගෙන සාදා ඇති බවත් නිගමනය කළෝය.

අවසානයේ දී එය කෞතුකාගාරය වෙත ලබා දෙන ලදි.

එය කෞතුකාගාරය තුළ තැන්පත් කිරීමට විශාල උත්සවය ක් සංවිධානය කර තිබුණි. ඒ සඳහා කසුනි ඇතුළු මිතුරියන්ට හා ඔවුන්ගේ දෙමව්පියන් ට ද ආරාධනා කර තිබුණි.

'' සුභ උදෑසනක් වේවා. අද අපි මේ සියලු දෙනාම රැස් වී සිටින්නේ ඉතාමත් වැදගත් අවස්ථාවක් සැමරීම සඳහා ය. එනම් ඉතාමත් වටිනා කෞතුක භාණ්ඩයක් අද අපේ මේ ජාතික කෞතුකාගාරය වෙත ලැබී තිබෙනවා. ඉතින් විශේෂම කාරණා ව නම් එම කෞතුක භාණ්ඩය අප වෙත ගෙනැවිත් භාර දෙනු ලැබුයේ, බාලදක්ෂිකාවන් සිව්දෙනෙකු විසින් වීම.එසේ නම් මා එම ලමයින් සිව්දෙනා හට ආරාධනා කර සිටිනවා මෙම ඉතා වටිනා කෞතුක භාණ්ඩ ය, අපගේ කෞතුකාගාරය තුළ තැන්පත් කරන ලෙසට.'' කෞතුකාගාර පාලකතුමන් කසුනි,සජනි,සඳනි හා දිනිති සමග එම වටිනා විස්කෝතුව කෞතුකාගාරයේ විශේෂ කුටියක තැන්පත් කළෝ ය.

• • •

''අද මං මේ රැඳී සිටින්නේ ජාතික කෞතුකාගාරයේ පවතින උත්සවයකයි. අපගේ ජාතික කෞතුකාගාරය ට ඉතා වටිනා කෞතුක භාණ්ඩයක් ලැබීම වෙනුවෙන්, එම කෞතුක භාණ්ඩය තැන්පත් කිරීමට ඉතා වැදගත් උත්සවයක් සංවිධානය කර තියනවා. ඉතින් මාත් එක්ක මේ වෙලාවේ රැඳී සිටින්නේ එම කෞතුක භාණ්ඩ ය සොයා ගත් බාලදක්ෂිකාවන් සිව්දෙනා යි. කියන්න බලන්න අපිට ඔයාලා මේක ගැන විස්තරය ක්.''මාධ්‍යවේදියා විසින් මයික්‍රෆෝනය කසුනිට ලබා දුන්නේය.

''ඇත්තටම, මේක ඉවර නොවෙන විස්කෝතු ව නමින් තමයි නම් කරලා තියෙන්නේ. ගොඩක් වැදගත් කෞතුක භාණ්ඩයක්. සියලු

දෙනා ට මම ආරාධනා කරනවා,ජාතික කෞතුකාගාරය ට ඇවිත් මේ, වටිනා කෞතුක වස්තුව නරඹන්න.'' කසුනි ඇනෙක්සි ගේ ඉල්ලීම පරිදි විස්කෝත්තු ව හමු වූ ආකාරය පිළිබඳ කිසිවක් හෙළි නොකළාය.

• • •

උත්සවයෙන් පසු රාත්‍රී භෝජන සංග්‍රහයක් සඳහා සැවොම කසුනිගේ නිවසට එක් වූහ.

ආහාර සුදානම් කරන තුරු වට සාකච්ඡාවක් දැමීම ට සියලු දෙනා කාමරය ට රැස් වූහ.

''දැන් අපි හරි ප්‍රසිද්ධයි නේ.'' ඇඳ මත හිතාගත් දිනිති කීවාය.

''ඔව් නේ...''

''හැබැයි අපි මතක තියාගන්න ඕනේ කාටවත් අපේ රහස නොකියා ඉන්න.'' සජනි කීවාය.

''ඔව් නැතුව කොහොමද?'' කසුනි කීවාය.

''එහෙනම් අපි හැමෝම පොරොන්දු වෙමු.'' සදනි තම අත දිගු කරමින් කීවාය.

සියලුම දෙනා තම තමන්ගේ අත්, ඇගේ අත මත තැබුවෝය.

''හිප් හිප් හුරේ. අපිට ජය වේවා.'' සියලු දෙනා එක්ව හඬ නැගූහ.

සතුටු සාමිචියේ යෙදමින් කසුනි, සදනි,සජනි හා දිනිති කාඩ් සෙල්ලම් කළෝ ය.

“පොඩ්ඩී, යාළුවො එක්ක පහළ ට එන්න. කෑම ලෑස්තියි.” කසුනිගේ මව තරප්පු පෙළ පහළ සිට තම දියණියට කතා කළා ය.

“එසේනම් බාලදක්ෂිකාවනි,ආහාර අනුභව කිරීමට ගමනේ යා.” කසුනි කීවාය.

සියලු දෙනාම පෙළ සෑදී, තරප්පු පෙළ බසිමින්, කෑම කාමරය වෙත සතුටින් පිය මැන්නෝය.

**නිමි.**



● ● ●

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත්අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප,පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරු බවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැපකිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමටද හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බල පරම්පරාව නූතන තාක්‍ෂණය සමග ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ,සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්